අරුණළු නැගෙන වේලෙහි දැනුණු නැවුම් බව බිදගෙන ලැබුණු දුරකථන ඇමතුමෙන් මාගේ එදින වැඩ කටයුතු පිළිබඳ වූ පූර්ව සැලසුම් සියල්ල අවුල් වී ගිහදැයි මට සිතුණි. එයට සවන් දුන් මම නැවතත් පැමිණ වැරෙන්ඩාවේ වූ දිගු පුටුවට බර උනෙමි. මම අරුණලු සඟවමින් කළුපැහැ ගැන්වෙමින් තිබූ අහස දෙස බැලුවෙමි. ඒ දුරකථන ඇස්මතුම ලැබුණේ මාගේ මිත්‍ර වසන්ත ගෙනි.

''මචං විජේ.. උඹට මතකද මාධවී.'' අනෙක් පසින් වසන්ත විමසුවේ කවරෙක් ගැන දැයි එකවර හදුනාගත
නොහැකිව මම මඳක් කලිපනා කළෙමි.
''ආ... අර මිරිඟුවේ. ''
''ඔව් බං . එයා මැරිලලු.''
''ඒ කොහොමද..''
''සුයිසයිඩ් කරගෙන.''
''හා.''
බොහෝ විට අතීතය දෙස හැරී බලමින් එහිම සැරිසැරීමට අකමැත්තක් දැක්වූ එහි තිබූ බොහෝ දෑ මකා දමන්න උත්සාහ කරන මම යලිත් වසර තිහක අතීතය පෙරළා බලන්නට වූයෙමි.
මාධවී නානායක්කාර මා හදුනාගන්නා විට ඇයට වයස අවුරුදු විසි පහක් පමණ වන්නට ඇත. ඇය මා හට හමුවූයේ නිළියක් ලෙසිණි. දක්ෂ තරුණ අධ්‍යක්ෂ වරයෙකු වූ වසන්ත සිය දෙවන සිනමාපටය සඳහා සුදුසු නවක මුහුණු සොයමින් සිටියේය. එවකට වේදිකාවට සම්බන්දව සිටි මා හමුවන්නට පැමිණි ඔහු එහි ප්‍රධාන චරිතය බාරගන්නා ලෙස මා හට නිතර ඇවිටිලි කරන්නට විය. උසස් අධ්‍යාපනයේ නිරත වෙමින් රැකියාවක ද නියලුණු මා බොහෝ විට ඔහුගේ මෙම ඉල්ලීම මගහරිමින් සිටියේ කාලය පිළිබඳ වූ ගැටළුව නිසාය. නමුත් සෙසු මගේ මිත්‍රයින් ඇතුළු බොහෝ දෙනාගේ පෙළඹවීමෙන් පසු අවසානයේ වසන්තගෙන් මම තිර පිටපත ඉල්ලා ගතිමි.

තිර පිටපත කියවන අතර තුර එහි වූ ඇතැම් දේ නිරූපනය කිරීම පිළිබඳ මගේ සිත තුළ යම් චකිතයක් අනිවන්නට විය. මන්ද එවන් නිරූපණයක් කිරීම පිළිබඳ නීර්භයක් මා වෙත නොවූ බැවිණි.

''මචං මේකේ තියෙන්නෙ ගෙඩි පිටින්නේ. මේවා කරලා මට පාරේ බැහැල යන්න පුළුවන් උනොත් ඇති.'' මා පිටපත කියවමින් ඇසුවෙමි.

"පිස්සුද බං. ඕක රියල් ස්ටෝරි එකක්.. උඹ ඕක කීප සැරයක් හොදට කියවපන්.''

,මේ ඉන්නේ ඔය ෆිල්ම් එකේ ප්‍රධාන ගැහැණු චරිතය.'' වසන්ත තම බෑගයෙන් ගත් ඡායා රූප කිහිපයක් මා
වෙත පෙන්විය. එහි සරාගී නෙත් සඟලකින් යුතු යුවතියකගේ විවිධ ඉරියව්වලින් ගන්නා ලද ඡායා රූප සමූහයකි.

"අලුත් ද...?''

මම ඒ ඡායාරූප එකින්නෙක බලමින් ඇසුවෙමි.
''හ්මි. කොහොමද හොදයිද... දැන් මොකද කියන්නේ...'' වසන්ත සිනාසෙමිණි ඇසුවේය.

වසන්ත පැවසූ ලෙස ඇය ඇමරිකානු සමාගමක ශ්‍රී ලංකාවේ කාර්යාලයේ පිළිගැනීමේ නිලධාරිනියක සහ දුරකථන ක්‍රියාකරවන්නියක සේ සේවය කරමින් සිටි බවත් වසන්තගේ පෙම්වතියගේ මිතුරියක් බවත් දැනගන්නට ලැබුණි. තිර පිටපන කියවූ ඇය මෙහි අරුණි ගේ චරිතය නිරූපනයට කැමති වූ බවත් ඔහු තවදුරටත් පැවසුවේය. ඈ වන් තරුණියක මේ සඳහා එකගවී සිටියදී මා මීට පසුබට වන්නේ මන්දැයි මා තුල සියුම් ලැජ්ජාවක් ඇති විය. ඒ සෑම සිතුවිල්ලක් සමග මාධවී මා අසලම ගැවසුණා දැයි මට සිතුණි.

සිනමාපටයේ මුහුරත් උළෙලේදී පළමුව සියැසින් දුටු මාධවී සමග රූගැන්වීම් ඇරඹුමත් සමඟ වඩාත් ළඟින් කටයුතු කරන්නට මා හට හැකි විය. පිටපතේ සඳහන්ව තිබූ ඇතැම් සිප ගැනීමේ දර්ශන රූගැන්වීමේ දී ඇය වඩා තදින් මා සිප ගත්තාය. ඒ දෙස වසන්ත පවා විශ්මයෙන් බලා සිටියා විය හැකිය. ඇතැම් විට ඔහු ''කට්. කට්.'' යැයි කියා තවත් තත්පර කිහිපයකට පසු ඇය මා අතහරී.

''මොකද විජේ බය වෙලා . ඔයාට තේරෙන් නැද්ද මේ සීන් එකට මේ දේවල් අත්‍ය වශයි..'' වසන්ත කීවට ''මොකද ඔහොම කුලෑට් උනොත් නම් හොඳ නළුවෙක් වෙන්න බැරිවෙයි ...'' ඇතැම් විට මාධවී එසේ පවසා සිනාසෙයි. මගේ නාසයෙන් හෝ නිකටෙන් අල්ලා සොලවයි.

ඇතැම් රූ ගැන්වීම් නැති දිනවල දර්ශන තලයෙන් පිටදීත් අපි මුණගැසුනෙමු. ඈ බොහෝවිට විවර වූ මනසකින් යුතුව කටයුතු කලා යයි විටක මට සිතුණි. ඈ හඳින පළදින දෑ පවා සෙසු
අයගෙන් වෙනසී විය. ඈ සිය විලාසිතා ගැන දැඩි උනන්දුවකින් සිටියාය. බොහොමයක් විලාසිතා යුරෝපයේ අලුතින් එළිදැක්වූ ඒවා විය. ඈ පිළිබඳව එවකට තිබූ කලා සඟරා බොහොමයක විවිධ තොරතුරු පල විය. එමෙන්ම දින දර්ශන සහ තරුණ පුවත්පත් කිහිපයකම කවරයේ ඇගේ රුව පලකොට තිබිණි. මම එතරම් ප්‍රසිද්ධියට ප්‍රිය නොවූ බැවින් මාධ්‍ය මගහරිමින්ගේ සිටියෙමි. එබැවිනී සිනමා පටය තිරගත වන තෙක් මා පිළිබඳ ලිපියක් හෝ දෙකක් පමණක් පළ වී තිබුණි.

මාධවී බොහෝ විට මා කැටුව යාමට පැමිණියේ ඇගේ කුඩා බීට්ල් රථයෙනි. මෙසේ අප දෙදෙනා ආ ගිය ගමන් අවසන් කෙලවර වූයේ වසන්තගෙන් ඇතිවූ දෝෂා රෝපණවලිනි.

''යකෝ ... නිකන් මෝඩයෙක් වගේ වැඩ කරන්න එපා බං... පත්තර කාරයෝ මගෙන් අහනව උඹල දෙන්න ගැන.''

ඉන් කෙටි කලකදී සිනමාපටයේ මංගල දර්ශනය කොළඹ රීගල් සිනමා ශාලාවේ දී පැවැත්විණි. මා සිනමා ශාලාවට පැමිණෙන විට මාධවී ශාලාව ඉදිරිපස ඡායාරූපවලට පෙනී සිටිමින් කැමරාකරුවන් පිරිවරා සිටියාය. ඔවුහු අතෝරක් නැති ප්‍රශ්න අසමින් සිටියේය. මා එහි එනු දැක ඇය ''විජේ කම්.. කම්.'' යි මා ඈ වෙනට කැඳවූවිට කැමරාකරුවෝ අප දෙදෙනාගේ ඡායාරූප ගැනීමට පටන් ගත්තෝය...

චිත්‍රපටයේ බොහෝ දර්ශන මනා සංයමයෙන් යුතුව කැමරාවෙන් රූපයට නගා තිබුණි. වසන්ත සෑහෙන දුර ගමනක් යා යුතු යැයි මම සිතුවෙමි. මෙහි ආකෘතිය පවා සම්ප්‍රදායික චිත්‍රපට ආකෘතියෙන් බැහැරව ගොඩනගා තිබුණි.

දර්ශනය නිමාවී පැවති සුභඳ තේපැන් සංග්‍රහයේදී අප වෙත පැමිණි බොහෝ විද්වත්තු සෙසු කලාකරුවෝ ඇතුළු විවිධ පිරිස් සුබපැතුම් එක් කළේය. එයිනුත් බොහොමයක් මටත් වඩා වසන්තට සහ නවක සුරූපිනිය වූ මාධවී වෙත ලැබුණි. එවකට ප්‍රිය සිනමාවේ කැපී පෙනුණු බොහෝ නළු වනට මෙන් ආකර්ශනීය පෙනුමක් මා සතු නොවුවද මා වෙත පැමිණි විදිවත් කලාකරුවන් කිහිප පලස්ම එම රංගනය ඇගයීමට ලක් කළේය.

''විජේට සෑහෙන සාර්ථක ගමනක් යන්න පුළුවන් වෙයි. මම දැක්ක තුන්වෙනි ලෝකයේ අපේක්ෂා අතර මංමුලාවුණු බලාපොරොත්තු කඩවුණු තරුණයෙකුගේ නියම ස්වරූපය විජේ ගෙන්...'' මා අසලට පැමිණි මාහාචාර්ය සෙනරත් බණ්ඩාර පැවසුවේය. මෙසේ කළ තවත් ඇගයීම් බොහොමයක් පසුව මා දුටුවේ පුවත්පත්වල පළකර තිබූ චිත්‍රපට විචාර ලිපි තුළිනි. එමෙන්ම එම වකවානුවේදීම මා සමග කළ සම්මුඛ සාකච්ඡා අසුරින් පලකල ලිපි කිහිපයක්ම පුවත්පත්වල තිබුණි.

මාධවී මේ වන විට තවන් චිත්‍රපට දෙකකට සම්බන්ධව සිටියාය. එවන් චිත්‍රපට සඳහා ආරාධනා ලැබුණත් ඒ පිළිබඳ උනන්දුවක් නොකල මම සුපුරුදු පරිදි නැවතත් වේදිකා නාට්‍යයවලට සම්බන්ද වුනෙමි. දිනක් වසන්නගෙන් මාධවී ගැන විමසූවිට ''ඒකිව අල්ලන්න බෑ දැන් .. දැන් ඉතින් කොහෙන් නවතීද දන්නේ නෑ..'' පවසා මා දෙස නෙත් කොනින් බලා සිනාසුනේය. මගේ මුහුණේ නැගුණු අදුර වටහා ගත් සේ වසන්ත මගේ කරට අතක් දමා.

''මේ අල්ලලා දාපන් මල්ලී.. උඹට හරියන්නේ නෑ.. ඕව..'' යි පැවසීය.

තමුන් ඈ එසේ අමතක කරන්නේ කෙසේ දැයි මට සිතුණි. ඈ විසින් මගේ සිතෙහි වැඩි කොටසක් නතු කරගෙන සිටි බව දැන උන්නේ මා පමණි. එය මාධවී පවා නොදැන සිටියා යයි මට සිතුණේ ඈය ඉතා මනරම් සරුංගලයක් සේ ඈත අහසේ ඈතින් ඈතට පාවී යනු බලා සිටින විටය. ඈ එසේ පාවී යනු දැක සතුටු වූ බොහෝ පිරිස අතර දුක් වූ එකම තැනැත්තා මා පමණක් විය.

චිත්‍රපටය තිරගතවී සති කිහිපයකට පසුව මා හට ලිපියක් ලැබුනේ පියාගෙනි. එහි ඉක්මනින් පැමිණයන ලෙස දන්වා තිබුණේය. දිගු සති අන්තයක් එළඹෙමින් තිබූ නිසා තවන් දින දෙකක නිවාඩුවක් සඳහා ටෙලිග්‍රෑමයක් යොමුකරමින් මම නිවස බලා පිටත් උනෙමි. රාත්‍රියේ ගමන අරඹා අළුයම් බදුල්ලට ළඟාවෙන දුම්රියේ නිදන මැදිරියක් වෙන්කරගත් මා එහි ආසනයක් මත දිගාවී, දෙනෙත් පියාගන්නේ දහසක් සිතිවිලි එකිනෙක මා වෙත ඇදගනිමින්ය. ඒ බොහෝ සිතුවිලි තුළ සිටියේ මාධවී පමණකි. ඇය විටක මා වෙත සොඳුරු සිනහවකින් සැරසී පැමිණ මා සිපගන්නේ වියරුවෙනි. එවන් විටක ඈ ඈතින් ඈතට පාවී ගොස් මට අත වැනුවාය.

ඈත කඳු වළල්ල අනරින් අරුණ කිරණ නැගෙන යාමයෙහි මම දුම්රියෙන් බැස ගතිමි. මා නිවස වෙන ළඟාවන විට වටින් ගොඩින් එළිය වැටී තිබූ මුන් අම්මාගෙන් තාත්තාගෙන් මුහුණු තුළ තිබුණේ දැඩි අඳුරු ස්වරූපයකි. තවත් මොහොතකින් ඒ අඳුර හෙණ හඬ නගමින් මා වෙන පතිත විය.

''තොට ලැජ්ජා නැද්ද යකෝ. කොහෙවත් ඉන්න ලංසි ගෑනු එක්ක මගුල් නටන්න. මේක අපි නම්බු පිට හිටපු ගම. උඹේ මේ විගඩම් නැටිලි හිංද දැන් ගම දාල යන්නයි වෙලා තිබෙන්නේ... අපිට පාරේ බැහැල යන්නන් බැරිවෙයි.'' නානා සිංහයකු මෙන් සිය කෝපය මා වෙත මුදා හැරියේය. ඔහුගේ ගෝරනාඩුව ඇසී ඇතුල් ගෙයි සිට එබී බැලූ මගේ වැඩිමහල් සොයුරිය වූ තමරා,

''අනේ අප්පච්චි කෑ ගහන්න එපා... වටේ පිටේ මනුස්සයන්ට ඇහුනොත් නරකයි.'' කීවාය.
කිසිත් නොකියූ නමුත් අම්මා ඔසරි පොටෙහී දෑස් පිස ගන්නාය.

කලාව කෙරෙහි වූ ලැදියාව නිසා පුද්ගලික වය සහ මා වටා පවුරක් මෙන් සිටි පිරිස් මාහට අමතක වීදැයි මට සිතුණි. එහෙත් ඒ වන විට මම සෑහෙන දුරක් පැමිණ සිටියෙමි. මෙය ඔවුන් තුළ මහත් කැළඹීමක් අති වන දෙයකැයි නිකමෙටවත් නොසිතීමද පුදුම සහගතය. චිත්‍රපටයක රගපාන බව කීවේ ද මා අක්කාට පමණි. තාත්තාට සිය කෝපය මුදාහරින්නට ඉඩහැර මම නිහඬව සිටියෙමි. ඇදුම් මාරු කරගෙන මිදුලේ කොනක තිබූ ලෑලි බංකුව මත වාඩිවී මම ඈත කඳු වළල්ල දෙස බලා උනිමි.

''කැළඹීම අඩුවෙලා... හුළං හැමීම සාමාන්‍ය යි...'' යි පවසමින් මා වෙත පැමිණි තමරා අක්කා රසකැවිලි කිහිපයක් අසලින් තබා දුම් දමන තේ කොප්පයක් මා අතට දුණි.

''චිත්‍රපටිය හොදයි. අපි බැලුව. '' අක්කා සිනාසෙමින් කීවාය.

''කවුද අපි කීවේ. මුණවීර අයියයි ඔයයි ද.'' මම ඇසුවෙමි. ''මොකද මස්සිනා කීවේ.. ?''

''එයා කීවා තාත්ත නම් මල්ලිව ඉතුරු කරන එකක් නෑ. මේක දැක්කොත් කියල. හැබැයි දිගටම රැඳුනොත් මල්ලි සෑහෙන දුර ගමනක් යයි කියල කිව.'' ඈ සිනාසෙමින් පැවසුවාය.

අම්මා ප්‍රමුඛ නිවැසියන් කෙරෙහි වූ අසීමිත බැඳීම හේතුවෙන් ඉන් වසර කිහිපයක් තුල මම කලාවෙන් දුරස්ථ වුනෙමි. සැබැවින්ම එය හුදකලා වීමකැයි කිව හැකියි. මා එසේ සිටීම ගැන අක්කාත් මුණවීර අයින් මා වෙත දොස් නැගුවෝය.

''උඹ ඉතින් පරණ මිනිස්සු දුන්න හණමිටිය බාර ගනින්...''මුණවීර අයියා කීව්වේය. නොබෝ කලකින් මා වෙත ගුරු පත්වීමක් ලැබුණි. නව පත්වීම මා සිටි ප්‍රදේශයේම මධ්‍ය මහා විද්‍යාලයකට ලබා ගැනීමට හැකි විය. කළුලෑල්ලක් මත තිබූ පැරණි සටහන් මකා දමා නව පරිච්ඡේදයක් ලියන්නාක් මෙන් අතීතය මකමින් වර්තමානය මම ලියන්නට වූයෙමි. එහි වූ දරුවන්ට නාට්‍ය හා රංගකලාවත් සිංහල විෂයත් මවිසින් ගනු ලැබීය. බොහෝ විට පාසලේ කලා කටයුතු බොහොමයක් මගේ මැදිහත්වීමෙන් සිදුවිය. එමෙනීම වසර කිහිපයක්ම පිට පිටම මා නිර්මාණය කළ පාසල් නාට්‍ය කිහිපයක්ම ඉදිරියට රැගෙන එන්නට මට හැකි විය.

''විජේ මෙහාට වෙලා නිකන් කාලෙ නාස්ති කරනවා.'' දිනක් මා සමග එකම පාසලේ සේවය කරන සමුද්‍රා පැවසුවාය.
''ඇයි ..''
''නෑ ඔච්චර දක්ෂකමක් තිබිල ඒකෙන් ප්‍රයෝජන නොගන්න නිසා, සමහර විට කොළඹ දිහා උන්නනම් හොඳ නමක් හදාගන්න තිබ්බ....''

''ඇයි මේ නමට මක්වෙලාද.'' මම ඇසුවෙමි. එවිට අප අසල සිටි අනුර පැවසුවේ,
''ඇයි සමුද්‍රා අහල නැද්ද මිරිගුව ෆිල්ම් එක.

37 වන පිටට